දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

සිංප්‍ර 1.1 - සිංහල භාෂා ප්‍රවේශය
SL 1.1 – Approach to the Sinhala Language

කාලය පැය තුන යි

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ)

---

## I කොටස

(01) (i) "පණකුරු පසෙකි එ ද - ලුහු ගුරු බෙයින් දස වේ
ගත'කුරු ද වේ විස්සෙක් - වහරට යුහු සිය බසැ."
සිදත් සඟරාවේ එන මේ පාඨය පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.

(ii) මෙහි දැක්වෙන අක්ෂර මාලාව වර්තමානය වන විට විකාශනය වී ඇති ආකාරය පෙන්වා දෙන්න.

(02) (i) "පෙර පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්."
මේ උද්ධෘතය ඇසුරු කරමින් සන්ධි යනු කවරේ දැ යි කෙටියෙන් හඳුන්වන්න.

(ii) සිංහල භාෂාවේ භාවිත වන ලෝප සන්ධි විධි නිදසුන් සපයමින් පහදන්න.

(03) (i) සිදත් සඟරාවේ දැක්වෙන "නමින් පර වැ බෙදනු ලබනුයේ විබත් නම්" යන ප්‍රකාශය ඇසුරෙන් විභක්ති යනු කුමක් දැ යි හඳුන්වන්න.

(ii) කර්ම විභක්තිය සහ එහි ප්‍රයෝග නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

(04) (i) "නේ සදන් සියො වැ එක සද අයුරක් වන සේ ගළපනු සමස් නම්." මේ පාඨය උපයෝගී කරගනිමින් සමාස හඳුන්වන්න.

(ii) වෙසෙසුන් සමස් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

## II කොටස

(05) (i) නාම සහ නාම පද පැහැදිලි කරන්න.

(ii) සිංහල භාෂාවේ නාම පද වර්ගීකරණය සමාලෝචනය කරන්න.

(06) (i) ක්‍රියාව යනු කුමක් දැ යි කෙටියෙන් හඳුන්වන්න.

(ii) සිංහල භාෂාවේ යෙදෙන ආඛ්‍යාත ක්‍රියා හා නාම ක්‍රියා සනිදර්ශන ව විමසන්න.

(07) (අ) අක්ෂර වින්‍යාස හා වාක්‍ය වින්‍යාස රීති පිළිබඳ අවධානය යොමු කරමින් පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

i. ඔවුහු එය පිලියෙළ කළ පිළිවෙලින් ම නො කරතියි අපට හැඟුණෝ ය.
ii. සාශ්ත්‍රඥයා ප්‍රස්ථාවනාව පෙරලමින්, කියවමින් වාක්‍ය ප්‍රස්ථරයෙහි සාදෘෂ්‍යතාවයන් විමසී ය.
iii. ලංකාලෝක මුද්‍රණාලාධිපතිතුමා ඇතුලු සේවක පිරිස එය අත්‍යාලංකාරයෙන් නිම කර ඇත.
iv. නුඹලා හෝ මම හෝ එයට නිධානය සෙවිය යුතු ය.
v. අපි අදිෂ්ටාන පූර්වක සිත් නැත්තන් වෙත් නම් පරාජය අපිට ධෛර්යක් නො වෙත්.

(ආ) පහත සඳහන් වාක්‍යයන්හි අංකිත පදවල ව්‍යාකරණ විභාග දක්වන්න.

i. ඕ තොමෝ මවෙත සෙනෙහස පෑවා ය.
ii. ගෙවිලිය ගොවියා ලවා කුඹුර කොටවයි.
iii. මෙ දෙව් ගණ නිති කෙරෙත් සුබසෙත.
iv. සැවුලන් නවදිනක් එළඹි බව කියා පැවේ හඬලමින.
v. කැණීම්වලින් ලද සෙල්මුවා පිළිමය එම සියවසේ බව නො පිළිගැනේ.

(08) (අ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. සියලු ඥාති මිත්‍රාදීහු මෙම ආරාධනාව පිළිගනිත්වා!
ii. එරට රජ්ජුරුවෝ මෙරට දැගැබ් කරවූහ.
iii. ගුරුළුගෝමීහු බමුණන් පරිභවයට ලක් නො කළහ.
iv. චීන තරුණියක් ලංකාවෙන් සහකරුවෙකු සොයයි.
v. සහෘදයෝ සැමවිට මා අගය කළහ.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.

i. මෙමඟින් සිත්තැවුලට පත්වූවෝ විකල්ප පක්ෂයක් විසින් සනසනු ලැබූහ.
ii. මා විසින් සෞන්දර්ය විද්‍යාල සිසුහු අභිමානයට ලක් කරනු ලබති.
iii. උපකුලපතිතුමා විසින් ශිෂ්‍ය නායකයන්ට වැදගත් කටයුත්තක් පවරනු ලැබුවේ ය.
iv. ගැමියන් විසින් අපි සාදරයෙන් පිළිගනු ලද්දෙමු.
v. අප විසින් විදෙස් ජනමාධ්‍යවේදීහු පසසනු ලැබූහ.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)